# මැතිවරණ මුදල් වියදම් සීමා කෙරෙන නව නීති

## පැෆරල් සංවිධානය අවධාරණය කරයි

ගයාශ්‍රී ගිහනලාරච්චි

**ඉදිරි** මැතිවරණයක දී අපේක්ෂකයන්ට වියදම් කළ හැකි මුදල් ප්‍රමාණයට සීමාවක් ඇතිකරමින් 20 වන සංශෝධනයේ කටයුතු ඉදිරියට ගෙන යාමට නව රජයේ ඉදිරි පාර්ලිමේන්තුව කටයුතු කළ යුතුව ඇතැයි පැෆරල් සංවිධානය පවසයි.

පසුගිය මැතිවරණවලට සාපේක්ෂව යම් අඩුවීමක් දැකිය හැකි වුවද මෙවර මැතිවරණයේදීත් අපේක්ෂක ප්‍රවර්ධනය උදෙසා විශාල වශයෙන් මුදල් වියදම් කරන බවක් දක්නට තිබූ බව පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ඊයේ (19) පැවැසීය.

එබැවින් ඒ තත්ත්වය වහා වෙනස් කිරීමේ අවශ්‍යතාවක් පවතින බව කොළඹ ඊයේ (19) පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී රෝහණ හෙට්ටිආරච්චි මහතා පෙන්වා දුන්නේය.